Department of Education Sabaragamuwa Province Weekly school / Department of Education Sabaragamuwa

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය : ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා**

**2021**

**සතිය : 02**

**6 ශ්‍රේණිය**

**සකස් කිරීම :**

# සරු බිමෙන් නෙළමු අපි අස්වනු

ගහකොළ වලින් පිරි සජීවී පරිසරයක් හා එක් විමට කැමති පුද්ගලයෝ තම ගෙවත්තේ විවිධ ප්‍රයෝජනවත් ශාක වගා කරති. එමගින් ඔවුන් ආර්ථික වාසි මෙන්ම තෘප්තියක් ද අත්කර ගනිති. ශාක වගා කිරීම සඳහා අපට තිබෙන සුදුසුම ස්ථානය ගෙවත්ත ය. ගෙවත්තේ ශාක වගා කිරීම මගින් සතුන් හා අලංකාරවත් ශාක වලින් පිරි සුන්දර පරිසරයක් නිර්මාණය කරගත හැක.

1. පාසල් ගෙවත්තේ වගා කිරීමට සුදුසු පහත බෝග වර්ග සඳහා උදාහරණ ලියන්න.
   - i. පලා වර්ග
   - ii. පලතුරු
   - iii. ඖෂධ
   - iv. කුළු බඩු
2. සිටුවීම සඳහා අප සකස් කර ගන්නා ශාක කොටස් රෝපන ද්‍රව්‍ය ලෙස හඳුන්වයි. පහත රෝපණ ද්‍රව්‍ය භාවිතා කරන බෝග සඳහා උදාහරණ දෙක බැගින් සඳහන් කරන්න.
   - i. පාත්තියේම බීජ සිටුවිය හැකි බෝග.
   - ii. බීජ තවාන් දමා පැල බෝකර සිටුවිය හැකි බෝග.
   - iii. දඬු කැබලි සිටුවා පැල කරගත හැකි බෝග.
   - iv. භූගත කඳන් සිටුවිට හැකි බෝග.
3. ගෙවත්තේ බෝග සිටුවීමට රාමුවක් සහිත උස් පාත්තියක් සාදා ගැනිමෙන් අත්කරගත හැකි වාසි තුනක් ලියන්න.
4. අපගේ ගෙවත්තේ වෙසෙන, පහත ක්‍රියා සිදුකරන වගා මිතුරු සතුන් සඳහා උදාහණයක් බැගින් ලියන්න.
   - i. ගෙවත්තේ පස බුරුල් කිරීම.
   - ii. පැල වලට හානි කරන කෘමි සතුන් ආහාරයට ගැනිම.
   - iii. ගොලුබෙල්ලන් විනාශ කිරිම.